Sinhalese / සිංහල

# ඔබගේ රාජ්‍යය පාර්ලිමේන්තුව පිළිබඳව

Community Education

Parliament of South Australia

## ආණ්ඩුවේ පවතින මට්ටම්

ඔස්ට්‍රේලියානු ආණ්ඩුවේ මට්ටම් තුනකි – දේශීය, රාජ්‍යය සහ ෆෙඩරල්.

**ෆෙඩරල්:** ෆෙඩරල් මට්ටමේ ආණ්ඩුව ඔස්ට්‍රේලියානු ව්‍යවස්ථාවේ දක්වා ඇති ප්‍රශ්ණ සඳහා වගකීම දරණ අතර, උදාහරණ ලෙස බදු, ජාත්‍යන්තර සබඳතා (බාහිර කටයුතු), ආරක්ෂක, සංක්‍රමණය සහ තවත් දේ වේ. ෆෙඩරල් මට්ටමින් සාදනු ලබන නීති මුලු ඔස්ට්‍රේලියාවටම බලපානු ලැබේ.

**රාජ්‍යය:** ඔස්ට්‍රේලියානු ව්‍යවස්ථාවේ දක්වා නැති ප්‍රශ්ණ සඳහා රාජ්‍යයන් වගකීම් දරණ අතර – ෆෙඩරල් ක්‍රමය ඇති කරනු ලබන අවස්ථාවේ රාජ්‍යයන් වලට අත්හරිනු ලබන කාරණා අඩංගු වේ. රාජ්‍යයන් වලට විශාල ප්‍රශ්ණ විසඳීමටද ඇත. අධ්‍යාපනය, සෞඛ්‍යය, හදිසි සේවාවන්, පරිසරය වැනි සහ තවත් කාරණා ද වේ.

**දේශීය:** ඔස්ට්‍රේලියාව පුරා දේශීය නගර සභා සිය ගනනක් ඇත. නිවසට ආසන්නයේ කාරණා බලා ගැනීම නගර සභා මගින් කරනු ලබන අතර, ප්‍රජා සේවාවන්, ක්‍රීඩාංගන, කසල එකතු කිරීම සහ ගොඩනැගිලි බලපත්‍ර නිකුත් කිරීම ඒ අතර වේ.

දකුණු ඔස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව ඇත්තේ රාජ්‍යය මට්ටමේය.




## බලය බෙදීම

ඔස්ට්‍රේලියාවේ, බලය 1) නීති සෑදීම, 2) නීතිය ක්‍රියාත්මක කිරීම, සහ 3) නීතිය පිලිබඳ තීරණ ගැනීම, යන ආදී ආණ්ඩුවේ වෙන්වූ බාහු ලෙස වෙන් කොට ඇති අතර එමගින් එක ආයතනයක් මගින් පාලනය කිරීම වැලකේ .

**පාර්ලිමේන්තුව/ව්‍යවස්ථාදායකය:** පාර්ලිමේන්තුව නීති සෑදීමේ ප්‍රමුඛයි. පාර්ලිමේන්තුවේ වැඩ කරන තේරී පත්වූ නියෝජිතයින් ජනතාව වෙනුවෙන් නීති සෑදීම කරනු ලබයි.

**විධායකය:** විධායකය යනු ඇමතිවරුන් (සමහර විට කැබිනට් මංඩලය ලෙස හඳුන්වනු ලබන) සහ විවිධ රාජ්‍යය දෙපාර්තමේන්තු වලට අයත් ඇමතිවරුන් යටතේ වැඩකරන රාජ්‍යය සේවකයන් අයත්වේ. විධායකය නීතිය ක්‍රියාත්මක කරනු ලබන අතර, හෝ, නීතිය ක්‍රියාවේ යොදවයි. උදාහරණයක් ලෙස, පොදු අධ්‍යාපන සේවාව සඳහා සාදා ඇති නීති පොදු පාසැලේ ගුරුවරියක් විසින් ක්‍රියාවේ යොදවයි. පොලීසිය විධායකය යටතේ වැඩකරන තවත් උදාහරනයක් වන අතර, විධායකය විසින් පනවනු ලැබූ අපරාධ නීතිය ක්‍රියාත්මක කරනු ලබයි.

**අධිකරණය:** අධිකරණය යනු උසාවි පද්ධතියකි. නීතිය පිළිබඳ තීන්දු දීම අධිකරණය සතු මූලික වගකීමක් වන අතර, උදාහරණයක් ලෙස, නීතිය නිවැරදි ලෙස යොදා ඇත්ද බව, හෝ එය දී ඇති බල රාමුව තුල යොදා ඇත්ද නැත්ද බව තීරණය කිරීම.

දකුණු ඔස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව ආන්ඩුවේ පාර්ලිමේන්තුව/ව්‍යවස්ථාදායකයේ බාහුවයි.



## දකුණු ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව

දකුණු ඕස්ට්‍රේලියාවේ ව්‍යවස්ථා පණතක් මගින් 1856 දී ද්විමණ්ඩල (නිවාස දෙකක) පාර්ලිමේන්තුවක් ප්‍රකාශයට පත් කලේය. එකී නිවාස දෙක රැස්වීමේ නිවස සහ ව්‍යවස්ථාදායක සභාව ලෙස හඳුන්වනු ලැබිය. ලෝකයේ පළමු රහස් ඡන්ද පත්‍රිකා ඡන්ද පැවැත් වූ අය අතුරින් එකක් වූද, ඉන් අනතුරුව පළමු රාජ්‍යය පාර්ලිමේන්තුව 1857 අප්‍රේල් මස 22 වන බදාදා දින හමු විය.

**රැස්වීමේ නිවස:** රැස්වීමේ නිවස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් (පාම න්) 47 දෙනෙකුගෙන් සමන්විත වේ. පාම න් 47 දෙනා දකුණු ඕස්ට්‍රේලියාවේ ජනතාව නියෝජනය කරමින් වසර 4 කාලයක් සඳහා තේරී පත්වීඇත. එක් පාම ක් දළ වශයෙන් ඡන්දදායකයින් 25,000 කින් සමන්විත ඡන්ද කොට්ටාශයක් නියෝජනය කරයි. බහුතරය ලබාගන්නා දේශපාලන පක්ෂය රැස්වීමේ නිවස තුල දකුණු ඕස්ට්‍රේලියාවේ රජය පිහිටවනු ලබන අතර, ඔවුන්ට විධායකය සඳහා ඇමතිවරුන් පත්කර ගැනීමට බලය ලැබේ. කථානායක නියෝග පවත්වාගෙන යන අතර, සහ රැස්වීමේ නිවසේ ලාංඡනය වන්නේ සෙංකෝලයයි.

**ව්‍යවස්ථාදායක සභාව:** ව්‍යවස්ථාදායක සභාව හී මන්ත්‍රීවරුන් (වසම න්) 22 ක් වේ. වසම න් දකුණු ඕස්ට්‍රේලියාවේ ජනතාව විසින් වසර 8 ක කාලයක් සඳහා පත්කරනු ලබන අතර , වසම න් මුලු රාජ්‍යයම නියෝජනය කරනු ලබයි. මින් අදහස් වන්නේ වසම න් 22 නාම ඔබ වෙනුවෙන් වැඩ කරන බවයි. ඡන්ද පත්‍රිකා ව්‍යවස්ථාදායක සභාව සඳහා වෙනස් ආකාරයකට ගනන් කරනු ලබන අතර, සුළු සහ ස්වාධීන පක්ෂ පාර්ලිමේන්තුව තුල වැඩිපුර සිටිනු බොහෝ විට දැකිය හැකිය. සභාපතිවරයා නියෝග පවත්වාගෙන යන අතර, ව්‍යවස්ථාදායක සභාවේ ලාංඡනය වන්නේ කලු දණ්ඩයි.

## පාර්ලිමේන්තුවේ කාර්‍යය

පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්‍යයන් හතරකි:

**නියෝජනය:** පාර්ලිමේන්තුව යනු දකුණු ඕස්ට්‍රේලියානුවන්ව මන්ත්‍රීවරුන් මාර්ගයෙන් නියෝජනය කරන ස්ථානයයි . පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ණය පිළිබඳ දුක් ගැනිවිලි ගැන, වැදගත් කාරණා ගැන, සහ රජය හා එහි මන්ත්‍රීවරුන් දකුණු ඕස්ට්‍රේලියාවේ ජනතාවට ඇහුන්කන් දීම සහතික කිරීමක් වශයෙන් ගෙනෙන යෝජනා ගැන කථා කල හැක.

**පරීක්ෂාව:** ඇමතිවරුන් පාර්ලිමේන්තුවේ වැඩ වලට මෙන්ම විවිධ වූ රජයේ දෙපාර්තමේන්තු වලට වග කිව යුතුවේ. මින් අදහස් වන්නේ ඔබගේ නියෝජිතයන් සහ වෙනස් වූ දේශපාලන පක්ෂ වලට ඔවුන්ව පරීක්ෂාවට ලක් කිරීම සහ ඔවුන්ගේ වැඩ පිළිබඳව ප්‍රශ්ණ කළ හැකි බවයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇමතිවරුන්ගෙන් ප්‍රශ්ණ ඇසිය හැක – ප්‍රශ්ණ අසන වෙලාවට මෙන්ම (දැන්වීමකින් තොරව ප්‍රශ්ණ) හෝ ප්‍රශ්ණයක් ඇසීම “දැන්වීමක් මගින්” යන ක්‍රමදෙක.

**මූල්‍යමය:** පාර්ලිමේන්තුව යනු රජයේ වියදම් අනුමත වන ස්ථානයයි. සෑම වසරකම අය වැය සම්මත විය යුතුය. එය සාමාන්‍යයෙන් හඳුන්වා දෙනු ලබන්නේ ඉදිරි මූල්‍ය වර්ශය සඳහා වූ ජූනි මාසය තුලය.

**ව්‍යවස්ථාදායකය:** දකුණු ඕස්ට්‍රේලියාවේ නීති සම්පාදනය හා වෙනස් කිරීම කරනු ලබන ස්ථානය වන්නේ පාර්ලිමේන්තුවයි.

## ගොඩනැගිල්ල

සම්භාව්‍යය ගොඩනැගිල්ල සතු කිරිගරුඬ කුලුණු, කොරින්තියන් අගනුවර සහ ප්‍රධාන ගල්කැටයම් 19 වන සියවසේ ආණ්ඩුකාරවරුන් ජනාධිපතිවරුන් හා කථානායකවරුන් පිලිබිබු කරයි. ප්‍රධාන ගොඩනැගිල්ලේ අමුද්‍රව්‍යය වශයෙන් කපුන්ඩා හී ඇති කිරිගරුඬ ද වික්ටර් හාර්බර් වලින් ග්‍රනයිට් ද භාවිතා කොට ඇත. බ්‍රිතාන්‍යය සම්ප්‍රදායට අනුකූලව වර්ණයන් ලෙස ව්‍යවස්ථාදායක සභාව රතු පැහැයෙනුත් රැස්වීමේ නිවස කොළ පැහැයෙනුත් වර්ණගන්වා ඇත. රැස්වීමේ නිවස විවෘත කරන ලද්දේ 1889 ජූනි මස 5 වන දින දීය.
1936 දී, සර් ලැන්ඩන් බොනයිතන් විසින් £100,000 ක් තෑගි වශයෙන් 1939 ජූනි මස 5 වන දින විවෘත කරන ලද ව්‍යවස්ථාදායක සභාවේ වැඩ කටයුතු පටන් ගැනීම පිණිස දෙන ලදී. අගමැතිවරුන් දෙදෙනෙකු වන, ටොම් ප්‍රයිස් (1905-1909) සහ ෆරැන්ක් වොල්ෂ් (1965-1967), යන දෙදෙනාම මේසන්වරුන් ලෙස වැඩබිමේ වැඩ කොට ඇත.

## සහභාගි වීම

**නැරඹීම:** පාර්ලිමේන්තු නිවාසය කිං විලියම් වීදිය හා නෝත් ටෙරස් කොනේ පිහිටා ඇත. නිවාස දෙකෙහිම සැසිවාර පැවැත්වෙන අවස්ථාවේදී මහ ජනතාවට විවෘත වන අතර නරඹන්නන් සාදරයෙන් පිළිගනී. පාර්ලිමේන්තු සභා වාර නොපැවැත්වෙන විටදී සතියේ දින වල පෙරවරු 10:00 සහ පස්වරු 2:00 මගපෙන්වන චාරිකා ඇත. සියළුම නැරඹීම් නොමිලේය. පාසැල් සහ කන්ඩායම් වශයෙන් නරඹන්නන් තම ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මගින් වෙන්කරවා ගත හැක. ඔබට පාර්ලිමේන්තුවට පැමින නැරඹිය නොහැකි නම්, ඔබට මාර්ගගතව සජීවී විකාශණයක් නැරඹිය හැකිය.

**හැන්සාර්ඩ්:** හැන්සාර්ඩ් යනු පාර්ලිමේන්තුවේ නිල වාද විවාද වල වාර්තාවයි. පාර්ලිමේන්තුවේ සියළු කටයුතු හැන්සාර්ඩ් වාර්තාවෙන් කියවිය හැක. පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියේ හැන්සාර්ඩ් වාර්තාව ඇත.

**කමිටු:** නිවාස වෙනුවෙන් සවිස්තරාත්මක වැඩ බාර ගැනීම සඳහා කුඩා කන්ඩායම් ලෙස මන්ත්‍රීවරුන් ගෙන් සැදුම්ලත් කමිටු ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සාක්ශි ලබාගැනීමටත් සහ සලකා බැලීමටත් ඔවුන්ගේ කොන්දේසි වලට අනුකූලව යම් කාරණා පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමටත් හැකිය. පොදු ජනතාවට කමිටු සමඟ තම අදහස් ඉදිරිපත් කිරීමෙන් සහ මහජනතාවට ඇහුන්කම් දෙන අවස්ථාවලදී පෙනී සිටීමෙන් එකිනෙකා අතර ක්‍රියා කළ හැකිය.

**පෙත්සම්:** පෙත්සමක් යනු ක්‍රියාත්මක වීම සඳහා කරනු ලබන ඉල්ලීමකි. ඕනෑම පුරවැසියෙකු, හෝ දකුණු ඔස්ට්‍රේලියාවේ පුරවැසි කණ්ඩායමක්, ක්‍රියාත්මක වීම සඳහා පාර්ලිමේන්තු නිවාසයට පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. උදාහරණයක් වශයෙන්, පෙත්සමක් මගින් යම් නීතියක් හඳුන්වාදෙන ලෙසට නිවාසයට ඉල්ලීමක් කළ හැකි, හෝ යම් පවතින නීතියක් ඉවත්කිරීමක් හෝ සංශෝධනය කිරීමක්, හෝ යම් කාරණාවක් සඳහා හෝ යම් පුද්ගලයකු වෙනුවෙන් ක්‍රියා කිරීමක් ඉල්ලා සිටිය හැක. පාර්ලිමේන්තුවට පෙත්සම් ඉදිරිපත් කිරීම සියළුම ජනතාවට දිගු කලක සිට පැවතගෙන එන මූලික අයිතිවාසිකමකි. එය තනි පුද්ගලයකුට හෝ කණ්ඩායමකට තම දුක්ගැනිවිලි පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කිරීමට අවකාශ සළසා දෙයි. එසේම එය ජනතාව හා පාර්ලිමේන්තුව අතර පවතින ඍජු සංනිවේදන මාර්ග කිහිපයකින් එක් මාර්ගයක් වේ.

**නිරූපනය කිරීම්:** පාර්ලිමේන්තුවේ පිය ගැට පෙළ මත නිරූපනය කිරීම් හෝ රැලි පැවැත්වීම් අනුමත නමුත් සංවිධායකවරුන් විසින් කථානායක ගෙන් සහ සභාපතිවරයා ගෙන් අනුමැතිය ලබාගැනීම උදෙසා ඉල්ලීම වැදගත්වේ. මෙය පාර්ලිමේන්තුවට පැමිනෙන මහජනතාවගේ හෝ පදික වේදිකාව හෝ මහාමාර්ගය සහ එම නිරූපනය කිරීම් හෝ රැලි පැවැත්වීම් වලට සහභාගි වන අයගේ සුබ සිද්ධිය සඳහා වේ.

**මන්ත්‍රීවරුන් හා සම්බන්ධවීම:** මන්ත්‍රීවරුන්ගේ සම්බන්ධතා තොරතුරු සඳහා වෙබ් අඩවියෙන් ලබා ගැනීමෙන් ඔබගේ ගැටළු පිළිබඳ ඔබගේ නියෝජිතයාට අදහස් ප්‍රකාශ කළ හැක.

## ෆෙඩරල් පාර්ලිමේන්තුව සමග සංසන්දනය

| | ෆෙඩරල් පාර්ලිමේන්තුව | |
|---|---|---|
| | නියෝජිතයන්ගේ නිවස | සෙනෙට් |
| වෙනත් නම් | පහළ නිවාසය | ඉහළ නිවාසය |
| මන්ත්‍රීවරුන් | 151 | 76 |
| නියෝජනය | එක් මන්ත්‍රීවරයෙක් ඡන්ද කොට්ඨාශයකට ඡන්ද 110,000 නියෝජනය කරනු ලබයි | සෑම සෙනෙට් සභිකයකුම තම රජය හෝ පලාත නියෝජනය කරනු ලබයි. එක් රජයකට සභිකයින් 12 ද සහ එක් පලාතකට සභිකයින් 2 ක්ද ඇත. |
| ධූර කාලය | වසර 3 | වසර 6 |
| ඡන්ද ක්‍රමය | මනාප | සමානුපාතික – තනි මාරුකල හැකි ඡන්ද |
| බල සීමාව | මුලු ඔස්ට්‍රේලියාවටම නීති සම්මත කිරීම | මුලු ඔස්ට්‍රේලියාවටම නීති සම්මත කිරීම |

| | දකුණු ඔස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව | |
|---|---|---|
| | රැස්වීමේ නිවස | ව්‍යවස්ථාදායක සභාව |
| වෙනත් නම් | පහළ නිවාසය | ඉහළ නිවාසය |
| මන්ත්‍රීවරුන් | 47 | 22 |
| නියෝජනය | එක් මන්ත්‍රීවරයෙක් ඡන්ද කොට්ඨාශයකට ඡන්ද 25,000 නියෝජනය කරනු ලබයි | එක් වසම ක් මුළු දකුණු ඔස්ට්‍රේලියාවම නියෝජනය කරනු ලබයි |
| ධූර කාලය | වසර 4 | වසර 8 |
| ඡන්ද ක්‍රමය | මනාප | සමානුපාතික– සමානුපාතික ක්‍රමය විකල්පය |
| බල සීමාව | දකුණු ඔස්ට්‍රේලියාවට පමනක් නීති සම්මත කිරීම | දකුණු ඔස්ට්‍රේලියාවට පමනක් නීති සම්මත කිරීම |

## අප සමග සම්බන්දවීම

දුරකතනය: +61 8 8237 9100 | 1800 182 097 (ගාස්තු රහිත)

ලිපිනය: තැපැල් පෙට්ටිය 572, ඇඩිලේඩ් එස් ඒ 5001, ඔස්ට්‍රේලියාව

පැමිනෙන්න: පාර්ලිමේන්තු නිවාසය, නෝත් ටෙරස්, ඇඩිලේඩ් එස් ඒ 5000, ඔස්ට්‍රේලියාව

විද්‍යුත් තැපෑල: LegCo@parliament.sa.gov.au (ව්‍යවස්ථාදායක සභාව)
Assembly@parliament.sa.gov.au (රැස්වීමේ නිවස)

වෙබ්: www.parliament.sa.gov.au

සමාජ මාධ්‍යය:
මුහුණු පොත: @parliamentsouthaustralia
ඉන්ස්ටගෑම්: @parliamentsouthaustralia
යූ ටියුබ්: South Australian Parliament
ට්විටර්: @LegCouncilSA | @AssemblySA